# ප්‍රතිඥාව / දිවුරුම

ශ්‍රී ලංකාව; ඔබ මම ආදරය කරන අපගේ ගෞරවනීය මාතෘභූමියයි. මේ වන විට විෂ මත්ද්‍රව්‍ය උවදුර විසින් අප දේශයේ අනාගතය පිළිබඳ අපේක්ෂාවන්ට බාධා කරවන ජාතික ව්‍යසනයක් නිර්මාණය කරනු ලැබ ඇත. එයින් අපගේ සමාජය පූර්ණ ලෙස මුදා ගැනීම වර්තමානයේ අප හමුවේ ඇති විශාලතම අභියෝගයයි. මෙම අභියෝගය ජය ගැනීම සමාජයක් ලෙස අත්හළ නොහැකි වගකීමක් බව අපි පිළිගනිමු.

මෙකී විෂ මත්ද්‍රව්‍ය උවදුර විසින් අප සමාජයේ ආර්ථික පැවැත්මද,සෞඛ්‍ය සම්පන්න ජීවිතයද, පවුලේ ආදරය සහ බැඳීමද, සතුට සහ විනෝදයද අහිමි කරනු ලැබ ඇත. ඒ හා සමාන ලෙස සංවිධානගත අපරාධවල මූලයක් බවටද එය පත්ව ඇත.

එබැවින් අපි;

විෂ මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදා හැරීම, අලෙවිය, ප්‍රවර්ධනය සහ ඊට අනුබල දීම මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමටත්, එරෙහි වීමටත්, ඊට සම්බන්ධ පිරිස් නීතිය හමුවට පැමිණ වීම සඳහා සහාය වීමටත් ප්‍රතිඥා දෙමු / දිවුරුම් දෙමු.

එසේම, විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට ඉන් මිදීමට උදව් උපකාර කිරීමටත්, ඔවුන් නැවතත් යහපත් සමාජ ජීවිතයක් කරා රැගෙන ඒමට උපකාර කිරීමටත් ප්‍රතිඥා දෙමු / දිවුරුම් දෙමු.

වර්ෂ 2025ක් වූ ඔක්තෝබර් මස 30 වන දා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී "රටම එකට" ජාතික මෙහෙයුම් සමාරම්භක උළෙලේදී අප විසින් ලබා දෙන මෙම ප්‍රතිඥාව අපගේ මාතෘ භූමියෙන් විෂ මත්ද්‍රව්‍ය උවදුර මුළුමනින්ම පිටු දකින තෙක්ම අත් නොහරින ජාතික වගකීමක් ලෙස සලකා ක්‍රියාත්මක වන බවටද ප්‍රතිඥා දෙමු / දිවුරුම් දෙමු.